# පුරවැසි ප්‍රඥප්තිය - හෝමාගම ප්‍රාදේශීය සභාව

<table>
<tr><th></th><th>ලබා දෙන සේවාව</th><th>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි</th><th>ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය</th><th>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක</th><th>කාර්ය නිම කිරීමට ගතවන අවම කාලය</th><th>අදාළ ගාස්තුව</th></tr>
<tr>
<td>01.</td>
<td>ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම</td>
<td>1. නිවැරදිව සම්පූර්ණ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල 1 වන උපලේඛනයේ අයදුම් පත්‍රය (ප්‍රාදේශීය සභා පෙරටු කාර්යාලයෙන් ලබාගත හැකි ය).<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්.<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 04ක් (ඉදිකිරීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවුද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය).<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමෙහි අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක්.<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික.<br>6. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්.<br>8. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩම් ඔප්පුවේ පිටපතක්.<br>9. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතු ය.</td>
<td>පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230</td>
<td>1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 011 2855230<br>2. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>3. සැලසුම් කමිටුව</td>
<td>දින 14</td>
<td>1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 300/=<br>2. පෙරසැරි ගාස්තුව
<table>
<tr><th rowspan="2"></th><th colspan="2">නේවාසික</th><th rowspan="2">නේවාසික නොවන</th></tr>
<tr><th>තනි පුද්ගල</th><th>මහල් නිවාස</th></tr>
<tr><td>400m² දක්වා (1m² සඳහා)</td><td>රු.20/=</td><td>රු.25/=</td><td>රු.25/=</td></tr>
<tr><td>401m² - 1000 m² (1m² සඳහා)</td><td>රු.22/=</td><td>රු.27/=</td><td>රු.27/=</td></tr>
<tr><td>100 m²- 1500 m² (1 m² සඳහා)</td><td>රු.25/=</td><td>රු.30/=</td><td>රු.30/=</td></tr>
<tr><td>1501m² - 2000 m² (1m² සඳහා)</td><td>රු.25/=</td><td>රු.32/=</td><td>රු.32/=</td></tr>
<tr><td>2000m² ට වැඩි (වැඩිවන සෑම 90m² සඳහා)</td><td colspan="3">රු.2000/= බැගින්</td></tr>
</table>
</td>
</tr>
</table>

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 02. | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවධර්න සැලසුම් අනුමත කිරීම | 1. නිවැරදිව සම්පූණර් කරන ලද 2021 නාගරික සංවධර්න අධිකාරියේ සැලසුම් හා සංවධර්න නියෝගවල 1 වන උපලේඛනයේ අයදුම් පත්‍රය (ප්‍රාදේශීය සභා පෙරටු කායර්ාලයෙන් ලබාගත හැකි ය).<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්.<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ඉඩම අනු බෙදුමට හෝ ඉඩම් ඒකාබද්ධ කිරීමට අදාළ මිනින්දෝරු සැලැස්ම සහ එහි සහතික කරන ලද පිටපත් 03 ක් (සංවධර්නයේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කායර්ාලයෙන් දැන ගැනීමට හැකි ය).<br>4. සංවධර්නයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.<br>6. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්.<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්.<br>8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියා පදිංචි කර තිබිය යුතු ය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230<br>2. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>3. සැලසුම් කමිටුව | දින 14 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 300/=<br>2. පෙරසැරි ගාස්තුව:<br>**බිම් කොටස් 1ක් සඳහා**<br>• 150m²- 300m²..... රු.1000/= (පර්චස් 06-12)<br>• 301m²- 600m²..... රු.800/= (පර්චස් 13-24)<br>• 601m²- 900m²..... රු.600/= (පර්චස් 25-36)<br>• 900m² ට වැඩි ....... රු.500/= (පර්චස් 36ට වැඩි) |

<table>
<tr><th></th><th>ලබා දෙන සේවාව</th><th>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි</th><th>ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය</th><th>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක</th><th>කායර් නිම කිරීමට ගතවන අවම කාලය</th><th>අදාළ ගාස්තුව</th></tr>
<tr><td>03.</td><td>සංවධර්න බලපත්‍රයක වලංගු කාලය දීඝර් කිරීම</td><td>1. නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය.<br>2. අනුමත කළ සංවධර්න සැලැස්මේ මුල් පිටපත.<br>3. නිකුත් කළ සංවධර්න බලපත්‍රයේ පිටපත.<br>4. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ දෙපැත්තේ සහතික කළ පිටපතක්.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩමේ හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.</td><td>පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230</td><td>1. තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230<br>2. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230</td><td>දින 7</td><td>1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත<br>2. පෙරසැරි ගාස්තුව:<br>වසරක් සඳහා රු. 5000/=</td></tr>
<tr><td>04.</td><td>අනුකූලතා සහතිකය නිකුත් කිරීම</td><td>1. නිවැරදිව සම්පූණර් කරන ලද අයදුම් පත්‍රය.<br>2. නිකුත් කළ සංවධර්න බලපත්‍රයේ සහ අනුමත සැලසුමේ පිටපතක් බැගින් (අනුකූලතා සහතිකය ලබා ගැනීමේ දී සංවධර්න බලපත්‍රයේ කාලය ඉකුත් වී ඇත්නම් කාලය දීඝර් කරගත යුතුය).<br>3. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.</td><td>පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230</td><td>1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 011 2855230<br>2. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>3. සැලසුම් කමිටුව</td><td>දින 14</td><td>1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.200/=<br>2. පෙරසැරි ගාස්තුව:
<table>
<tr><th rowspan="2"></th><th colspan="2">නේවාසික</th><th rowspan="2">නේවාසික නොවන</th></tr>
<tr><th>තනි පුද්ගල</th><th>මහල් නිවාස</th></tr>
<tr><td>400m² දක්වා</td><td>රු.4000/=</td><td>රු.5000/=</td><td>රු.5000/=</td></tr>
<tr><td>400m² ට වැඩිවන සෑම 1m² හෝ ඉන් කොටසක් සඳහා</td><td>රු.15/=</td><td>රු.20/=</td><td>රු.25/=</td></tr>
</table></td></tr>
</table>

<table>
<tr><th></th><th>ලබා දෙන සේවාව</th><th>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි</th><th>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය</th><th>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක</th><th>කායර් නිම කිරීමට ගතවන අවම කාලය</th><th>අදාළ ගාස්තුව</th></tr>
<tr>
<td>05.</td>
<td>අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමැතිය දීම</td>
<td>
1. 2021 නාගරික සංවධර්න අධිකාරියේ සැලසුම් හා සංවධර්න නියෝගවල 1 වන උපලේඛනයේ අයදුම් පත්‍රය (ප්‍රාදේශීය සභා පෙරටු කායර්ාලයෙන් ලබාගත හැකි ය).<br>
2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්.<br>
3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 04ක් (ඉල්ලීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කායර්ාලයෙන් දැන ගැනීමට හැකි ය).<br>
5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික.<br>
6. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.<br>
7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්.<br>
8. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්.
</td>
<td>පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230</td>
<td>1. තාක්ෂණ නිලධාරි / මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 011 2855230<br>2. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>3. සැලසුම් කමිටුව</td>
<td>දින 28</td>
<td>
1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.300/=<br>
2. පෙරසැරි ගාස්තුව:
<table>
<tr><th rowspan="2"></th><th colspan="2">නේවාසික</th><th rowspan="2">නේවාසික නොවන</th></tr>
<tr><th>තනි පුද්ගල</th><th>මහල් නිවාස</th></tr>
<tr><td>400 $m^2$ දක්වා (1 $m^2$ සඳහා)</td><td>රු.20/=</td><td>රු.25/=</td><td>රු.25/=</td></tr>
<tr><td>401 $m^2$ - 1000 $m^2$ (1 $m^2$ සඳහා)</td><td>රු.22/=</td><td>රු.27/=</td><td>රු.27/=</td></tr>
<tr><td>1000 $m^2$- 1500 $m^2$ (1 $m^2$ සඳහා)</td><td>රු.25/=</td><td>රු.30/=</td><td>රු.30/=</td></tr>
<tr><td>1501 $m^2$- 2000 $m^2$ (1 $m^2$ සඳහා)</td><td>රු.25/=</td><td>රු.32/=</td><td>රු.32/=</td></tr>
<tr><td>2000 $m^2$ ට වැඩි<br>(වැඩිවන සෑම 90 $m^2$ක් සඳහාම)</td><td colspan="3">රු.2000/= බැගින්</td></tr>
</table>
3. ප්‍රමාද ගාස්තු:
<table>
<tr><th></th><th>සංවධර්නයේ ස්වභාවය</th><th colspan="2">ගාස්තු (බදු රහිත)</th></tr>
<tr><td>1.</td><td>අනුමැතිය ලබා නොගෙන සිදු කළ ඉඩම් බෙදීමක් සඳහා</td><td colspan="2">කැබලි 1ක් සඳහා රු.3000/= බැගින්</td></tr>
<tr><td>2.</td><td>අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/ එකතු කිරීම්/ නැවත ඉදිකිරීම්</td><td>නේවාසික (1m2 සඳහා)</td><td>නේවාසික නොවන (1m2 සඳහා)</td></tr>
<tr><td>i.</td><td>අත්තිවාරම් වැඩ පමණක් සම්පූණර් කර ඇති විට (කයිරු මට්ටම දක්වා)</td><td>රු. 200/=</td><td>රු. 500/=</td></tr>
<tr><td>Ii.</td><td>වහල මට්ටම දක්වා ඉදිකිරීම් - ටැම් හා බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර)</td><td>රු. 300/=</td><td>රු. 1000/=</td></tr>
<tr><td>Iii.</td><td>වහලය සහිත බිත්ති ඉදිකිරීම</td><td>රු. 400/=</td><td>රු. 1500/=</td></tr>
<tr><td>iv.</td><td>පදිංචිවීම සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූණර් කිරීම</td><td>රු. 500/=</td><td>රු. 2000/=</td></tr>
<tr><td>v.</td><td>මායිම් තාප්ප/ රැඳවුම් බිත්ති ඉදිකිරීම</td><td>රු. 200/= (දික් මීටරයක් සඳහා)</td><td>රු. 500/= (දික් මීටරයක් සඳහා)</td></tr>
<tr><td>vi.</td><td>විදුලි සංදේශ, සම්ප්‍රේෂණ හා ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම</td><td colspan="2">බිම් පාදම ඉදි කිරීම රු. 150000/=<br>වහල මුදුන ඉදි කිරීම රු. 100000/=</td></tr>
<tr><td>3.</td><td>අනුකූලතා සහතිකය ලබා නොගෙන පදිංචි වීම</td><td colspan="2">දිනකට රු. 100/=</td></tr>
<tr><td>4.</td><td>වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුල ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු)</td><td colspan="2">සියළුම වාහන සඳහා රු. 250000/=</td></tr>
<tr><td>5.</td><td>රථ වාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිත කිරීම</td><td colspan="2">එක් ඉඩක් සඳහා රු.20000/=ක් සහ අනුමත සැළැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවතර්නය වන තෙක් වසරකට 10%ක වධර්කයක් සහිතව</td></tr>
</table>
</td>
</tr>
</table>

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 06. | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.<br>2. ඉඩමට අදාළ අනුමත කරන ලද මිනින්දෝරු සැලැස්මේ පිටපතක්.<br>3. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කළ පිටපතක්.<br>4. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.<br>5. සභාවට අයවීමට ඇති සියලු මුදල් ගෙවා අවසන් කර තිබිය යුතු ය. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1. තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230<br>3. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230 | දින 01 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.200/=<br>2. සහතිකය සඳහා ගාස්තුව රු.600/= |
| 07. | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.<br>2. පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වන විට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සහතික කළ පිටපතක්. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230<br>3. මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 011 2855230 | දින 14 | 1. පෙරසැරි ගාස්තුව රු.2000/= සිට රු. 5000/=<br>2. බලපත්‍ර ගාස්තුව රු.1000/=<br>(සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් සඳහා පසුගිය වසරේ ආදායමෙන් 1%ක් බලපත්‍ර ගාස්තුව ලෙස අය කරනු ලැබේ).<br>3. මුද්දර බද්ද රු.100/= |
| 08. | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ව්‍යාපාර බදු නිවේදනය. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 28552301.<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | විනාඩි 15 | බදු නිවේදනයේ සඳහන් මුදල<br>රු.180/= සිට රු.3000/= දක්වා |
| 09. | වරිපනම් අය කිරීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ තක්සේරු නිවේදනය. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | විෂය භාර නිලධාරි<br>☎ 011 2855230 | විනාඩි 15 | තක්සේරු නිවේදනයේ දැක්වෙන සම්පූර්ණ මුදල (දේපල අනුව වෙනස් වේ) |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 10. | කමර්ාන්ත බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ කමර්ාන්ත බදු නිවේදනය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | විනාඩි 15 | බදු නිවේදනයේ සඳහන් මුදල;<br>රු.500/= සිට රු.1000/= දක්වා |
| 11. | පරිසර ආරක්ෂණ බලපත්‍රය | 1. නිවැරදිව සම්පූණර් කරන ලද අයදුම් පත්‍රය.<br>2. කමර්ාන්තය හෝ ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානයට යන මාගර්යේ දළ සටහනක්.<br>3. කායර්යේ යොදවන සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර.<br>4. ව්‍යාපාරය ලියා පදිංචි කිරීමේ සහතිකයේ, සහතික කළ පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ).<br>5. ව්‍යාපාරය කරගෙන යන ස්ථානයට අයත් ඉඩමේ ඔප්පුවේ පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ).<br>6. කමර්ාන්තය / ව්‍යාපාරය කරගෙන යන තැනැත්තාට ඉඩමේ අයිතිය නොමැති නම්, අයිතිකරු සමග එළඹ ගත් ගිවිසුමක් වේ නම් එය හෝ ඉඩමේ අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපියේ සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ).<br>7. ඉඩමේ අනුමත කළ මිනින්දෝරු සැලැස්මේ සහතික කළ පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ).<br>8. අනුමත ගොඩනැගිලි සැලැස්මේ සහතික පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ). | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ප්‍රජා සංවධර්න නිලධාරි<br>☎ 011 2855230<br>3. පරීක්ෂණ කමිටුව<br>4. තාක්ෂණික කමිටුව | දින 14 | 1. අයදුම් පත්‍රය රු.100/=<br>2. අලුත් කිරීමට රු.50/=<br>3. පෙරසැරි ගාස්තුව -ආයෝජනය කරන මුදල අනුව වෙනස් වේ.<br>4. බලපත්‍ර ගාස්තුව රු. 4,000/= |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 12. | ප්‍රචාරක දැන්වීම් ප්‍රදශර්න අවසර පත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය;<br>2. A4 කඩදාසියක මුද්‍රණය කරන ලද, ප්‍රදශර්නය කිරීමට අදහස් කරන දැන්වීමෙහි සමරූපී ආදශර්යක් (යොදා ගනු ලබන වණර් ද සහිතව).<br>3. කිසියම් මාගර්යක රක්ෂිතයක සවි කර ප්‍රදශර්නය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළවන පරිදි ඒ මාගර්යේ අයිතිය ඇති මාගර් සංවධර්න අධිකාරිය හෝ පළාත් බද මාගර් සංවධර්න අධිකාරිය හෝ පළාත් පාලන ආයතනය විසින් ඒ සඳහා අවසර දුන් ලිපියේ මුල් පිටපත.<br>4. කිසියම් මාගර්යක රක්ෂිතයක සවි කර ප්‍රදශර්නය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදශර්නය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියේ මුල් පිටපත.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ අයිතිකරු නොවන විට, දැන්වීම ප්‍රදශර්නය කරනු ලබන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ඒ සඳහා ඉඩදෙන ලද බව ප්‍රකාශිත ලිපියේ මුල් පිටපත.<br>6. 2021 නාගරික සංවධර්න අධිකාරියේ සැලසුම් හා සංවධර්න නියෝගවල 104 වන නියෝගය යටතේ නාගරික සංවධර්න අධිකාරිය විසින් හෝ සභාව විසින් අනුමත කළ බලපත්‍රයේ සහතික කළ පිටපත. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230. | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | දින 3 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 100/=<br>2. අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති පරිදි දැන්වීමේ වගර් ඵලය මත අවසර පත්‍ර ගාස්තුව;<br>$1m^2$ක් සඳහා රු. 1000/=<br>වැඩිවන සෑම $1m^2$ක් සඳහාම රු. 300/= |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්ය නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 13. | ආදාහනාගාරය වෙන් කරවා ගැනීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ පිටපතක් (පරීක්ෂා කර බැලීමට මුල් පිටපත අවශ්‍ය වේ).<br>3. මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ පිටපතක් (පරීක්ෂා කර බැලීම සඳහා මුල් පිටපත අවශ්‍ය වේ. විදේශයක දී සිදු වූ මරණයක් වන විට, ඒ රටේ දී නිකුත් කළ මරණ සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විට, ඉංග්‍රීසි පරිවර්තනයක් සමඟ). | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1. රාජකාරි වේලාව තුල:<br>විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. රාජකාරි වේලාවෙන් පරිබාහිරව:<br>☎ 011 2855230 | විනාඩි 15 | 1. බල ප්‍රදේශය ඇතුළත රු. 9000/=.<br>2. බල ප්‍රදේශයෙන් පිටත රු. 9750/= |
| 14. | සිහිවටන ඉදි කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ පිටපතක් (පරීක්ෂා කර බැලීමට මුල් පිටපත අවශ්‍ය වේ).<br>3. මියගිය තැනැත්තාගේ මරණ සහතිකයේ පිටපතක් (පරීක්ෂා කර බැලීම සඳහා මුල් පිටපත අවශ්‍ය වේ. විදේශයක දී සිදු වූ මරණයක් වන විට, ඒ රටේ දී නිකුත් කළ මරණ සහතිකය ඉංග්‍රීසි භාෂාවෙන් නොවන විට, ඉංග්‍රීසි පරිවර්තනයක් සමඟ). | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1.විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2.තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230 | විනාඩි 15 | 1. ආදාහනාගාරයක් ඇති සුසාන භූමියක රු.7500/=<br>2. ආදාහනාගාරයක් නොමැති සුසාන භූමියක රු.5000/= |
| 15. | මාගර් පළුදු කිරීමට අවසර ඉල්ලීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය<br>2. පළුදු කිරීමට අදහස් කරන මාගර්යේ නියමිත ස්ථානයට ළඟා විය හැකි පහසු මාගර්ය පෙන්නුම් කරන දළ රූප සටහනක්.<br>3. අදාළ සේවා සම්බන්ධතාව සපයන ආයතනය විසින් නිකුත් කළ ලිපියේ පිටපතක්. | පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230 | 1.විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2.තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230 | දින 2 | 1. පළුදු කිරීමේ ප්‍රමාණය හා මාගර්යේ ස්වභාවය අනුව ගෙවීමට/ තැන්පත් කිරීමට අවශ්‍ය මුදල වෙනස් වේ.<br>2. සහතිකපත් ගාස්තුව රු. 85/= |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 16. | ගස්වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම | නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1.විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2.තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230 | දින 3 | ගාස්තු අය නොකෙරේ |
| 17. | විනෝද බද්ද අය කර ගැනීම සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම | 1. විනෝද බද්ද අය කර ගැනීමේ කායර්ය සඳහා -<br>i. අලෙවි කිරීම සඳහා සූදානම් කළ මුද්‍රිත ප්‍රවේශ පත්‍ර;<br>ii. අන්තජර්ාලය ඔස්සේ අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල විද්‍යුත් මුද්‍රාව තැබීම සඳහා පරිගණක මුර පදය.<br>2. විනෝද බද්දෙන් නිදහස් කිරීමකට අදාළ වන විට, ඉහත 1 හි පරිදි ක්‍රියා කරමින්;<br>i. අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල වටිනාකම අනුව, පළමුව විනෝද බද්දට සමාන මුදල සභාවේ තැන්පත් කළ යුතු ය.<br>ii. විනෝද බද්ද තැන්පත් කරන අවස්ථාවේ දී විනෝද කායර්යේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුව.<br>iii. විනෝද කායර්ය අවසන් වී දින 30කට පෙර විනෝද කායර්යේ සත්‍ය ආදායම් හා වියදම් විස්තරය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | 1. දින 02<br>2. ඇමුණුම 02 භාර දුන් දින සිට දින 7 | එක් එක් ප්‍රවේශ පත්‍රයේ මුහුණත වටිනාකමෙන්;<br>1. සිනමා ශාලා 10%<br>2. සිනමා ශාලා නොවන 15% |
| 18. | උත්සව ශාලා / නගර ශාලා / ප්‍රජා ශාලා කුලියට දීම | නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | ශාලාව වෙන් කිරීම විනාඩි 15 | 1. උත්සව ශාලා ගාස්තුව<br>පෙරුම්බුලි ශ්‍රවනාගාරය - දිනකට රු.5000/=<br>2 . ප්‍රජා ශාලා ගාස්තුව<br>මසකට රු.1000/= සිට රු.1500/= දක්වා |

<table>
<tr><th></th><th>ලබා දෙන සේවාව</th><th>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි</th><th>ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය</th><th>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක</th><th>කාර්ය නිම කිරීමට ගතවන අවම කාලය</th><th>අදාළ ගාස්තුව</th></tr>
<tr><td>19.</td><td>ක්‍රීඩා පිටි කුලියට දීම</td><td>නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.</td><td>1. පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230<br>2. ක්‍රීඩා භූමිය භාර නිලධාරි<br>☎ 011 2855230</td><td>1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230</td><td>ක්‍රීඩා පිටිය වෙන් කිරීම විනාඩි 15</td><td>1. ක්‍රීඩා පිටි ගාස්තුව<br>රු.1000/= සිට රු.10000/= දක්වා<br>2. ආරක්ෂිත ඇපය<br>රු.10000/=</td></tr>
<tr><td>20.</td><td>මල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව ලබා දීම</td><td>නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.</td><td>පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230</td><td>ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230</td><td>බවුසරය වෙන් කිරීමට විනාඩි 15</td><td>1. බවුසර් ගාස්තුව
<table>
<tr><th></th><th>බල ප්‍රදේශය තුළ</th><th>බල ප්‍රදේශයෙන් පිටත</th></tr>
<tr><td>නේවාසික</td><td>රු.5000/=</td><td>රු.5500/=</td></tr>
<tr><td>වානිජ</td><td>රු.5500/=</td><td>රු.6500/=</td></tr>
<tr><td>කර්මාන්ත</td><td>රු.7500/=</td><td>රු.8500/=</td></tr>
<tr><td>රාජ්‍ය</td><td>රු.5000/=</td><td>රු.6500/=</td></tr>
</table>
(අමතරව 1% මුද්දර ගාස්තු එකතු විය යුතුය)<br>2. ප්‍රවාහන ගාස්තු- කි. මී. 1කට රු.60/= බැගින්</td></tr>
<tr><td>21.</td><td>ජල බවුසර් සේවාව ලබා දීම</td><td>නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය.</td><td>පෙරටු කාර්යාල නිලධාරි<br>☎ 011 2855230</td><td>ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230</td><td>බවුසරය වෙන් කිරීමට විනාඩි 15</td><td>1. බවුසර් ගාස්තුව රු.2500/=<br>3. ප්‍රවාහනය කි. මී. 1කට රු.45/= බැගින්<br>(1% මුද්දර ගාස්තු එකතු විය යුතුය)</td></tr>
</table>

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 22. | මෝටර් ග්‍රේඩර් සේවාව ලබා දීම | නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | මෝටර් ග්‍රේඩරය වෙන් කිරීමට විනාඩි 15 | ගාස්තුව පැයකට රු.9500/=<br>( 1% මුද්දර ගාස්තු එකතු විය යුතුය) |
| 23. | බැකෝ ලෝඩර් සේවාව ලබා දීම | නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | බැකෝ ලෝඩරය වෙන් කිරීමට විනාඩි 15 | ගාස්තුව පැයකට රු.9500/=<br>(1% මුද්දර ගාස්තු එකතු විය යුතුය) |
| 24. | දේපළ හිමිකම ලියාපදිංචි කිරීම හා සංශෝධනය කිරීම | 1. නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය (පිටපත් 2 කින් යුක්ත ව).<br>2. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඔප්පුවේ පිටපත් 2 ක්. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230 | දින 5 ක් | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.250/=<br>2. පෙරසැරි ගාස්තුව නැත |
| 25. | ඇතැම් ඉඩම් විකිණීම මත බදු | සභාව විසින් තමන් වෙත එවනු ලැබූ ඇතැම් ඉඩම් විකිණීම මත බදු නිවේදනය. | 1. ආදායම් පරීක්ෂක<br>☎ 011 2855230<br>2. පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | විෂය භාර නිලධාරි<br>☎ 011 2855230 | විනාඩි 15 | ඉඩම විකුණන ලද මුදල් වටිනාකමෙන් සියයට එක (1%) ක් |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | ඍජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 26. | ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි බලපත්‍ර නිකුත් කිරීම | 1 නිවැරදිව සම්පූණර් කළ අයදුම් පත්‍රය;<br>2. A4 ප්‍රමාණයේ කඩදාසියක අඳින ලද, සැණකෙළියේ කායර්යට යොදා ගන්නා සෑම අංගයක් ම පෙන්නුම් කරන සැණකෙළි භූමියේ දළ රූප සටහනක්.<br>3. ඒ ස්ථානයට රැස් වන මහජනතාවට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් (ස්ත්‍රී, පුරුෂ සහ ආබාධිත අයට වෙන වෙනම) සපයනු ලබන බවට තහවුරු කරන ලිපියක්.<br>4. ඒ ස්ථානයේ ඉදි කර ඇති තාවකාලික ගොඩනැගිලි ප්‍රමාණවත් සවි ශක්තියකින් යුක්ත වන බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයකු විසින් නිකුත් කළ සහතිකයක්.<br>5. ඒ යම් ගොඩනැගිල්ලක රැස් වන මහජනතාවට දූෂණයට ලක් නොවූ හා ප්‍රමාණවත් වාතාශ්‍රය පවතින බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්.<br>6. හදිසි ගිනි ගැනීමක දී යොදා ගත හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ (සාමාන්‍ය ගිනි නිවීම්, විදුලි ගිනි නිවීම් සහ ඉන්ධන ගිනි නිවීම් උපකරණ) යොදා ගනු ලබන බව තහවුරු කරන ලිපියක්;<br>7. ආපදා අවස්ථාවක දී, රැස් වී සිටින ජනතාව ඉතා කෙටි කාලයක් ඇතුළත ඉන් ඉවත් කිරීමට ප්‍රමාණවත් පිටවීමේ දොරටු සහ ආරක්ෂිත වැඩ පිළිවෙළ යොදා ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක්.<br>8. සැණකෙළි භූමිය තුළ සාමය පවත්වා ගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළ යොදා ඇති බවට ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද සහතිකයක්. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | 1. විෂය භාර නිලධාරි<br>☎ 011 2855230<br>2. තාක්ෂණ නිලධාරි<br>☎ 011 2855230<br>3. මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>☎ 011 2855230 | දින 2 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත<br>2. පෙරසැරි ගාස්තුව නැත<br>3. බලපත්‍ර ගාස්තුව:<br>දිනකට රු.200/=<br>සතියකට රු.500/=<br>මාස 03කට රු.750/=<br>වෂර්යකට රු.1000/= |

| | ලබා දෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කායර් නිම කිරීමට ගතවන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 27. | නිවාස නොවන ස්ථානවල කසළ ඉවත් කිරීම | නිවැරදිව සම්පූණර් කරන ලද අයදුම් පත්‍රය. | පෙරටු කායර්ාල නිලධාරි<br>☎ 011 2855230 | ප්‍රජා සංවධර්න නිලධාරී<br>☎ 011 2855230 | දින 3 | කසළ ඉවත් කිරීමේ ගාස්තුව:<br>දිරන අපද්‍රව්‍ය ටොන් 1ක් සඳහා - රු.3000/=<br>දිරන අපද්‍රව්‍ය ටොන් 1ක් සඳහා - රු.4000/=<br>ට්‍රැක්ටර් ලොඩ් 1ක් සඳහා - රු.10000/= |

**අපගේ කැපවීම**

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාර සම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂය මූලිකව හා අපක්ෂපාතිව
- විනිවිද භාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කායර්ක්ෂමව හා සපලතාවයෙන්

ලබාදීමට කැපවී සිටින්නෙමු.

**අපගේ අපේක්ෂාව**

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තුති කරන අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූණර් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපේක්ෂා කළ හැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා තිබීම මගින් ද ඔබට අපට සහයෝගය පළකළ හැකි බව දන්වනු කැමැත්තෙමු.

**අපගේ ප්‍රමිතීන්**

ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකටම ක්ෂණික ප්‍රතිචාර අපෙන් ලැබෙනු ඇත. අපේ ප්‍රතිචාරය දින 07 ක් ඇතුලත දී ඔබට ලැබෙනු ඇත.

ඔබේ ඉල්ලීම සමඟ ඉල්ලා ඇති තොරතුරු, ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්, ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබා දීමට අපි බැඳී සිටින්නෙමු.

අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවායර්යෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් ක්ෂණිකව දන්වනු ලැබේ.

**පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය**

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව, අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබා දෙනු ලැබේ. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත කරුණාකර ලියාපදිංචි කරන්න.

නම :- K.B.T.K. ගුණතිලක මහත්මිය

තනතුර :- ලේකම්

ස්ථානය :- හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය

දුරකථනය :- 0112895121 ෆැක්ස්:- 0112857169

ඊමේල්:-homagamapradeshiyasabawa@gmail.com

නම :- D.M.P.D. සුරේන්ද්‍ර මහතා

තනතුර :-

ස්ථානය :- හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය

දුරකථනය :- 0112895121 ෆැක්ස්:- 0112857169

ඊමේල්:-homagamapradeshiyasabawa@gmail.com

- සියළු පැමිණිලි ලද බව දින 03ක් ඇතුළත දන්වන අතර අවසාන පිළිතුර දින 07ක් ඇතුළත දන්වනු ලැබේ.

- සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.
  - අ. අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමඟ අප අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලැබේ. ඔබ අප සමඟ සම්බන්ධ - වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 0704537650 දුරකථන අංකයෙන් අමතන්න.
  - ආ. මෙම ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති කරුණු පිළිබඳ ඔබේ උපදෙස් ලබා ගැනීමට හෝ ඔබේ අදහස් ලබාදීමට ඔබ දක්වන කැමැත්ත ඇතුළත් කර ඔබගේ විස්තර අපගේ https://www.homagama.ps.gov.lk/ වෙබ් අඩවියට ඇතුළත් කරන්න.

පුරවැසි ප්‍රඥප්තිය; අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරණ ඒකාබද්ධ ප්‍රයත්නයකි. ලබාදෙන සේවය තවත් වැඩි දියුණු කිරීමට පහත දක්වා ඇති විස්තර (ආයතනයට අදාල විස්තර සඳහන් කරන්න) ලබා දීමෙන් අපට උපකාරී වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රඥප්තිය යටතේ ලබාදෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි බැඳී සිටිමු.**